# ඇබෑර්තු දැන්වීමයි

## සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය

# පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පුරප්පාඩු වී පවතින තනතුරු සඳහා මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචි සුදුසුකම් ලාභීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු)

**තනතුරට අදාළ සුදුසුකම්**

(අ) අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පොත් තබන්නා තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ කළමනාකරු (ව්‍යාපෘති) තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ආ) බැංකු කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම සමග අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක්/ ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක්/ පොත් තබන්නා තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් හෝ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ ග්‍රාමීය බැංකු අංශයේ ගිණුම් සහකාර තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක/ පිළිගත් ආයතනයක ගණකාධිකරණ/ වාණිජ/ කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/ වානිජ/ කළමනාකරණ ඩිප්ලෝමාව සමත්වීම.

**හෝ**

(ඈ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අදියර ll ( Charted Level ll ) / ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර II ( A.A.T. Level II ) සමත් වීම.

I. **වැටුප් හා දීමනා**

- වැටුප් පරිමාණ අංකය - E.L - 02:02
- වැටුප් පරිමාණය - 30,000 - 600 × 10 - 900 × 10 X 1,200 × 10 = 57,000/-
- වැටුපට අමතරව මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා හිමි වේ.
- තම කාර්ය සාධනය අනුව ආකර්ෂණීය දිරි දීමනා සඳහා හිමිකම් ඇත.

II. **වයස් සීමාව**

වයස් සීමාව අවු. 18 - 45 අතර

**02. පරිගණක පද්ධති පරිපාලක**

**තනතුරට අදාළ සුදුසුකම්**

(අ) ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ කළමනාකරු 1 තනතුරේ (ස.ණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම සමග පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ වසරකට නොවැඩි අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් (පරිගණක ජාලකරණය පරිගණක දත්ත ආරක්ෂාව) සමත් වීම.

**හෝ**

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා, තොරතුරු තාක්ෂණ , වානිජ යන අංශවලින් විභාගයෙන් විෂයයන් 04 කින් (පැරණි නිර්දේශය) / 03 කින් සමත් වීම (නව නිර්දේශය) සමග පරිගණක ජාලකරණය, පරිගණක දත්ත ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම.

**1. වැටුප් හා දීමනා**

- වැටුප් පරිමාණ අංකය - SL - 04 : 03
- වැටුප් පරිමාණය - 27,000 - 540 × 10 - 810 × 10 - 1,080 X 10 = 51,300/-
- වැටුපට අමතරව මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා හිමි වේ.
- තම කාර්ය සාධනය අනුව ආකර්ෂණීය දිරි දීමනා සඳහා හිමිකම් ඇත.

II. **වයස් සීමාව**

වයස් සීමාව අවු. 18 - 45 අතර

**පොදු කරුණු**

- අයදුම්කරුවන් මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන් විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් ඉටු කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත පුද්ගලයින් විය යුතුය.
- මෙම තනතුරු පිළිබඳ ලබා ඇති පුහුණුව විශේෂ සුදුසුකමක් වනු ඇත.
- පරිගණක දැනුම හා ඉංග්‍රීසි දැනුම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම**

- අයදුම්පත් මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 2/2011 චක්‍ර ලේඛයේ සඳහන් ආකෘතියට අනුව සකස් විය යුතුය.
- 2/2011 චක්‍රලේඛනය අනුව සකස් කළ අයදුම්පත් සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පලාපත්වල පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් ද ලබාගත හැකිය.
- අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගැනීමේ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, පදිංචිය සනාථ කිරීමේ සහතිකය, ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය යන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.
- **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024.07.18 දින වේ.**

ඉහත සඳහන් තනතුරකට ඔබත් සුදුස්සෙක් නම් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත ලිපිනයට අයදුම්පත් භාර ගැනීමේ දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් යොමු කරන්න.

**ගරු සභාපති,**
**සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය,**
**පලාපත්වල, මාතලේ.**
2024.06.25
066-2220335 / 2220333/2220383